**පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 2017**

**-------------------------------------**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5), 108 සහ 111 වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය අනුව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 48 ඡේදය ප්‍රකාරව ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකල යුතු වුවත් විශ්වවිද්‍යාලයේ විවිධ කාර්යයන් වෙනුවෙන් ආරම්භ කර තිබූ අරමුදල් 578 ක ආදායම රු.807,612,337 ක්වූ මුළු ආදායමෙන් වියදම රු.829,459,858 ක් හිලව්කර ශුද්ධ අගය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.652,890,045 ක් වූ පුස්තකාල පොත් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) අයිතිය හෝ පැවැත්ම තහවුරු කළ නොහැකි මහනුවර හා කුරුණෑගල රෝහල්වල ඉදිකිරීම් සඳහා 2017 දෙසැම්බර් 31 දින දක්වා විශ්වවිද්‍යාලය විසින් දරන ලද රු.3,899,479 ක වියදම 2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි.

(iii) ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව, දේපල, පිරියත උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විට එම වත්කම් අයත්වන දේපල පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් ශාස්ත්‍ර පීඨයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ඉංග්‍රීසි භාෂා ඒකකය භාවිතා කරමින් තිබූ රු.377,240 ක් වටිනා පරිගණක 04 ක් ඇතුළුව අයිතම් 06 කට අයත් වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පරිත්‍යාග ගිණුම්වල ශේෂ එකතුව රු.4,690,558,085 ක් වූ අතර එම පරිත්‍යාගවලට අදාල වත්කම් ක්ෂය කර තිබූ නමුත් පරිත්‍යාග ගිණුමේ ශේෂය ක්‍රමානුකූල පදනමක් යටතේ ආදායමට හඳුනාගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු රු.1,291,366 ක මුදලක් "පරිත්‍යාග අරමුදල්" යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ලද ප්‍රතිපාදන මුදල ඉක්මවා විශ්වවිද්‍යාල අරමුදලින් දරා තිබූ රු.308,669,345 ක් වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට හර කර තිබීම හේතුවෙන් එම ගිණුමේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් සහ වැයකල ප්‍රාග්ධන ගිණුමේ ශේෂය සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) වැය විෂයන් 05 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.258,744 ක බැර ශේෂ දක්වා තිබූ අතර එම ශේෂ හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.

(ඈ) ස්ථාවර තැන්පතුවකට අදාලව බැංකුවට සෘජුවම බැරවී තිබූ රු.371,290 ක පොළිය ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) විගණනයේදී සිදු කල ගණනය කිරීම් අනුව, සමාලෝචිත වර්ෂයේ ආයෝජන ආදායම රු.110,112,139 ක් වුවත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.109,827,896 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම ආදායම රු.284,243 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ව්‍යාපෘති 04 කට අදාළව අතුරු ගෙවීම් බිල්පත්වලින් අඩුකර ගෙන තිබූ රු.6,282,494 ක අත්තිකාරම් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) 2014 දෙසැම්බර් 31 දිනට සේවක ණය ගැලපුම් ගිණුමේ හර ශේෂය ලෙස රු.45,399 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත් එම ශේෂය හඳුනාගෙන නිවැරදි කිරීමට වසර 03 ක කාලයක සිට කටයුතු කර නොතිබුණි.

(ඌ) විශ්ව විද්‍යාලය සතු ඉඩම් බදු දීම තුලින් 2017 දෙසැම්බර් 31 දින දක්වා අයවිය යුතු එකතුව රු.18,366,000 ක් වූ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ලැබිය යුතු ලෙස ගිණුම්ගත කිරීමද සිදුකර නොතිබුණි.

### 2.2.4 පැහැදිළි නොකළ වෙනස්කම්

--------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය ලේඛනය අනුව ආපදාණය ශේෂය රු.1,020,003 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.1,459,900 ක් වූයෙන් රු.439,897 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

----------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|---|
| | --------- | ------------ | --------------------- |
| | | රු. | |
| (අ) | සැපයුම් සේවා හා වෙනත් අත්තිකාරම් ශේෂ | 270,722 | ශේෂ තහවුරු කිරීම් හෝ අත්තිකාරම් ලේඛන |
| (ආ) | ණයගැති ශේෂ | 3,552,329 | ශේෂ සනාථ කිරීම් හෝ ණයගැති ලේඛනය සහ කාලවිශ්ලේෂණය |
| (ඇ) | තොගය | 3,509,033 | භෞතික සමීක්ෂණ වාර්තා |
| (ඈ) | විශ්වවිද්‍යාලයට අනුබද්ධ මධ්‍යස්ථාන 07 ක වියදම් | 103,375,169 | ප්‍රගති වාර්තා |
| (ඉ) | නඩත්තු කටයුතු වෙනුවෙන් ලබා දුන් ද්‍රව්‍ය හා උපකරණ | 39,082,787 | පිරිවැය ඇස්තමේන්තු |
| | | -------------- | |
| | | 149,790,040 | |
| | | ========= | |

(ඊ) 2016 වර්ෂයේදී ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී පිරිවැය රු.228,844,650 ක් වූ ලෙජර් ගිණුම් 27 ක පැවති වත්කම් ශේෂ ප්‍රත්‍යාගණන ගිණුමට මාරුකර තිබූ නමුත් ප්‍රත්‍යාගණන වටිනාකම් නැවත එම ගිණුම්වල නොදක්වා වෙනත් වත්කම් ගිණුම්වලට හර කිරීම හේතුවෙන් එම වත්කම්වල නිවැරදි වටිනාකම් විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

## 2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වී තිබූ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් විශ්වවිද්‍යාලය සමග එළඹි ගිවිසුම් උල්ලංඝනය කිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ආචාර්යවරුන් 127 දෙනෙකුගෙන්, රු.91,020,204 ක් අයවිය යුතුව තිබුණි. තවද, විගණන නියැදි පරීක්ෂාවට අනුව විදේශ අධ්‍යයන නිවාඩු අවසන් කර වසර 02 ක කාලයක් ගත වී තිබූ නමුත් නැවත සේවයට වාර්තා කර නොතිබූ ආචාර්යවරුන් 03 දෙනෙකුට අදාල බැඳුම්කර වටිනාකම වූ රු.22,746,557 ක මුදල 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ලෙස හඳුනාගෙන ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගේ ලැයිස්තුවට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට සැපයුම්කරුවන් 07 දෙනෙකු වෙත ගෙවිය යුතු රු.27,069,573 ක් වසරකට අධික කාලයක් තිස්සේ, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කාර්යමණ්ඩලයේ 11 දෙනෙකු විසින් ලබා නොගත් වැටුප් හා දීමනා රු.1,295,973 ක් 2017 දෙසැම්බර් 31 දිනට වසර 01 සිට වසර 03 දක්වා කාලයක් ගතවී තිබුණද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ පීඨ 09 ක සිසුන්ගෙන් අයවිය යුතු රු.1,886,950 ක් වූ ශාලා ගාස්තු හා රු.5,519,602 ක් වූ දඩ මුදල් ලෙස එකතුව රු.7,406,552 ක මුදලක් 2017 දෙසැම්බර් 31 දිනට වසර 02 සිට වසර 36 දක්වා කාලයක් ගත වී තිබුණද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දින වනවිට සැපයුම්, සේවා සහ වැටුප් අත්තිකාරම් ලෙස ලබාදී තිබූ ශේෂ 22 කට අයත් රු.2,130,641 ක මුදලක් වසර 01 සිට වසර 16 ක කාලයක් ගතවී තිබුණද, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 189 | විශ්වවිද්‍යාලයේ බැංකු ගිණුම් 2 ක තැන්පත් කරන ලද එහෙත් මාස 06 සිට වසර 05 ක කාලයක සිට උපලබ්ධි නොවී පැවති රු.178,343 ක් වටිනා චෙක්පත් 25 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 (ඇ) | වසර 02 සිට වසර 05 දක්වා කාලයක් පියවා නොතිබූ රු.3,943,797 ක අත රඳවුම් ශේෂ 14 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (iii) ෙරගුලාසි 770 | 2016 දෙසැම්බර් 31 දිනට සිදු කළ භාණ්ඩ සමීක්ෂණයේදී විනාශ කළ යුතු හා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත යුතු එකතුව රු.1,714,283 ක් වටිනා අයිතම් 38 ක් හා පිරිවැය හඳුනාගත නොහැකි අයිතම 39 කට අයත් භාණ්ඩ සම්බන්ධයෙන් මාස 18 ක කාලයක් ගත වී තිබුණද, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2009 නොවැම්බර් 13 දිනැති අංක පීඑෆ්/එෆ්එස්/BOARD OF SERVEY/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයෙන් පසුව විකිණීම සඳහා නිර්දේශ කර තිබූ විවිධ වර්ගයන්ට අයත් රු.16,355,290 ක් වටිනා අයිතම 340 ක් සහ පිරිවැය හඳුනා ගත නොහැකි අයිතම 337 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 79 | නියදි පරීක්ෂාවේදී චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි රු.10 සිට රු.1,000 දක්වා වූ අයිතමයන් 99 ක් ස්ථාවර වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ට අනුකූලව 2016 වර්ෂයට අදාළව සිදුවී ඇති වැරදි අතීතානුයෝගිව නිවැරදි කිරීමෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග දක්වා ඇති 2016 වර්ෂයේ ඌනතාවය රු.113,459,245 කින් වැඩිවීමක්ද, මුළු වගකීම් රු.21,945,236 කින් වැඩිවීමක්ද, ස්කන්ධය රු.284,881,302 කින් වැඩිවීමක්ද, දක්වා ඇතත්, එය නිවැරදි කිරීම සඳහා විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය ප්‍රකාරව සියලුම අතිරික්ත මුදල්, මුදල් ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය මත ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, කෙටිකාලීන තැන්පතු හෝ වෙනත් ඵලදායී ආයෝජනයක යෙදවිය යුතු වුවත්, විශ්වවිද්‍යාලය මගින් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතුවල ආයෝජිත රු.95,500,000 ක මුදල සඳහා ඒ අනුව අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.662,292,910 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.190,389,026 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.471,903,884 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.50,995,404 කින් වැඩි වී තිබුණද සේවක පාරිශ්‍රමික රු.254,361,495 කින් හා ස්ථාවර වත්කම් ක්ෂය රු.248,875,901 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2015 වර්ෂයේදී හැර අනෙකුත් සෑම වර්ෂයකම ඌනතාවයක් ඇති වී තිබූ අතර 2013 වර්ෂයේදී රු.655,872,586 ක්වූ එය 2016 වර්ෂයේදී රු.662,292,910 ක් දක්වා වැඩි වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.2,212,155,421 ක් වූ විශ්වවිද්‍යාලයේ දායකත්වය 2016 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු.4,135,808,262 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයට අයත් විද්‍යා පීඨයේ 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ උපාධිධාරී සේවා නියුක්තිය සියයට 64 සිට සියයට 70 දක්වා පරාසයක විය.

(ආ) විශ්වවිද්‍යාලයේ 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව, ශාස්ත්‍ර පීඨය සහ විද්‍යා පීඨය යටතේ ක්‍රියාත්මකවන අධ්‍යාපන දෙපාර්තමේන්තු 27 ක ජාත්‍යන්තර ප්‍රමිති තත්ත්වයන්ට ළඟා වීමට හැකි වන පරිදි උපාධි අපේක්ෂක පාඨමාලාවල ප්‍රමිතිය වැඩි දියුණු කිරීමේ කටයුතු 2018 අගෝස්තු 30 දින වන විටත් සම්පූර්ණකර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ රු.74,663,524 ක මූල්‍ය අක්‍රමිකතාවයකට අදාළව 2017 ජූනි 20 දින හා 2017 ජූලි 18 දින නිකුත් කළ විගණන විමසුම් සම්බන්ධයෙන් 2017 ජූනි 30 දින උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක එච්ඊ/එෆ්අයිඑන්/12/06/පීඩීඑන් දරන ලිපිය මගින් ලබා දී තිබූ උපදෙස් පරිදි කටයුතුකර නොතිබුණි.

(ආ) විද්‍යා පීඨයේ ස්ථාන 14 ක ස්ථාපිත කර තිබූ ගිනි නිවීමේ උපකරණවල කල් පිරීමේ දිනය විගණන දිනය වූ 2018 පෙබරවාරි 10 දින වන විට වසර 10 කට අධික කාලයක් ඉක්ම ගොස් තිබූ නමුත් ඒ සඳහා කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) වෛද්‍ය පීඨයේ මහාචාර්යවරියකගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වෛද්‍යවරියක් ලෙස කටයුතු කර ඇති මෙම වෛද්‍යවරිය 2004 පෙබරවාරි 16 දින සෞඛ්‍ය සේවයෙන් මුදා හැර තිබූ අතර, 2004 ජනවාරි 01 දින විශ්වවිද්‍යාලයේ සේවයට වාර්තා කර තිබූ අතර පත්වීම් දිනය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 21 වැනි ඡේදයට අනුකූල නොවන පරිදි 2010 සැප්තැම්බර් 25 පැවති 390 වැනි පාලක මණ්ඩල රැස්වීමේදී වසර 03 ක කාලයක් සඳහා එකවර එම නිලධාරිනියගේ පරිවාස කාලය දීර්ඝ කර තිබුණි.

(iii) පත්වීම් ලිපිය ප්‍රකාරව මාස 06 ක කාලයක් තුළදී උප්පැන්න සහතිකය හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් සමග සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතු වුවත්, මෙම වාර්තාවේ දින වන විට වසර 14 කාලයක් ගත වී තිබුණද එම ලේඛන ඉදිරිපත් කර නොතිබුණු අතර විශ්වවිද්‍යාලයද ඒවා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) මෙම මහාචාර්යවරිය රු.3,805,782 ක ඇප බැඳුම්කරයක් මත 2006 අප්‍රේල් 05 දින සිට 2009 ජූනි 04 දක්වා මාස 39 ක කාලයක් සඳහා එක්සත් ජනපදයේ MRC Psych විභාගය සඳහා සායනික පුහුණුව වෙනුවෙන් ගිවිසුම්ගත වී තිබුණද, අදාළ අවශ්‍යතාවයන් සම්පූර්ණ කර නොතිබියදී ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් විශ්වවිද්‍යාලය විසින් ගෙන නොතිබුණි. එහෙත් ඇය විසින් එක්සත් ජනපදයේ සිට කරන ලද ඉල්ලීමක් මත ඔස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය සඳහා අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව වෙනුවෙන් උක්ත ගිවිසුම මාස 03 කුත් දින 09 ක කාලයක් දීර්ඝ කිරීමට විශ්වවිද්‍යාල පාලන අධිකාරිය 2008 ඔක්තෝබර් 10 දින කටයුතුකර තිබුණි.

(v) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 01/2010 හා 2010 දෙසැම්බර් 10 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 01(C) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි අධ්‍යයන කාර්යය මණ්ඩලවල වසර 12 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අදාළ තනතුරේ ස්ථිර කර ඇති නිලධාරීන් සඳහා බදු සහන මත මෝටර් රථ ආනයන බලපත්‍ර ලබාගැනීම සඳහා හිමිකම් පවතින බව දක්වා තිබුණි. එහෙත් ඊට අනුකූල නොවන ලෙස 2011 ජූලි 05 දිනට වසර 07 ක සේවා කාලයක් පමණක් සම්පූර්ණ කර තිබියදී මෙම වෛද්‍යවරිය වෙත මෝටර් රථ ආනයන බලපත්‍රයක් ලබා දී තිබුණි.

**4.3 අරමුණුවලට පටහැනි ගෙවීම්**

විශ්වවිද්‍යාලය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් මහනුවර හා කුරුණෑගල මහ රෝහල්වල සංවර්ධන කටයුතු සඳහා රු.7,421,683 ක් විශ්වවිද්‍යාලයේ අරමුණු හා කාර්යයන්ට පටහැනිව වැය කර තිබුණි.

**4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015 දෙසැම්බර් මාසයේදී නිකුත් කර ඇති ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි අධ්‍යයන පාඨමාලා සමාලෝචනය සම්බන්ධයෙන් වන අත්පොතෙහි 7 වන නිර්නායකයට අනුව විභාග සැලසුම් කිරීම, ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම, ඒවා වැඩිදියුණු කිරීම, හරි වැරදි බැලීම, ශ්‍රේණිගත කිරීම සහ සමාලෝචනය (Designing, Setting, Moderating, Marking, Grading, Monitoring and Reviewing) සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන නිශ්චිත ක්‍රමවේදයන් සකස් කර විශ්වවිද්‍යාල සනාථන සභාවේ විධිමත් අනුමැතිය ලබා ගත යුතු අතර එය විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය ප්‍රජාවගේ අවධානයට යොමු කිරීමට කටයුතු කළ යුතු වුවත්, ශාස්ත්‍ර පීඨය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇගයීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය සහ විශ්වාසනීයත්වය පවත්වාගෙන යාම වෙනුවෙන් උත්තර පත්‍ර ඇගයීම සඳහා ආයතනයට බාහිර ප්‍රවීනයන් යොදා ගැනීම හෝ/සහ උත්තර පත්‍ර දෙවැනිවර හරි වැරදි බැලීමේ ක්‍රමවේදයන් හඳුන්වා දිය යුතු වුවත්, ශාස්ත්‍ර පීඨය යටතේ ක්‍රියාත්මක සියලුම අධ්‍යයන දෙපාර්තමේන්තු විසින් බාහිර ප්‍රවීනයන්ගේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ආර්ථික විද්‍යා, නීති, සමාජ විද්‍යා, පුරා විද්‍යා යන අධ්‍යයන දෙපාර්තමේන්තු විසින් උත්තර පත්‍ර දෙවැනිවර ඇගයීමක් (Second Marking) සිදුකර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි විගණනයේදී අනාවරණය කර ගැනීමට නොහැකි විය.

(ඇ) ඉහත (අ) හි සඳහන් අත්පොතට අනුව, ශිෂ්‍ය ඇගයීම් ක්‍රියාවලිය සඳහා සම්බන්ධ වන අධ්‍යයන කාර්යය මණ්ඩලය එකී වගකීම් දැරීම සඳහා ප්‍රවීනයන් වන බවට සහතික විය යුතු වුවත්, නියැදි පරීක්ෂාවන්වලදී අනාවරණය වූ පරිදි දෙපාර්තමේන්තු 03 ක සේවයේ නියුතුව සිටි තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම, වැඩිදියුණු කිරීම, උත්තර පත්‍ර හරි වැරදි බැලීමේ කාර්යයන්හි නියුතුව ඇති බව අනාවරණය විය. කෙසේ වුවද, එකී ආචාර්යවරුන් විගණන දිනවූ 2018 සැප්තැම්බර් 04 දිනට සේවයෙන් ඉවත්ව ගොස් ඇති බවද නිරීක්ෂණය විය.

**4.5 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෛද්‍ය පීඨයේ වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව රු. 7,595,150 ක මුදලකට 2015 අගෝස්තු 20 දින මිලදී ගෙන තිබූ Urodynamic System with Accessories නැමැති උපකරණය මගින් 2017 පෙබරවාරි 10 වන විට රෝගීන් 07 දෙනෙකු පමණක් පරීක්ෂා කිරීමට භාවිතා කර තිබුණි. එක් රෝගියෙකුගෙන් රු. 12,000 ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් අය කරන බව අනාවරණය වූ අතර, රු. 7,595,150 ක මුදලක් වැය කර මිලදී ගෙන තිබුණු මෙම උපකරණය වසර 02 කට වැඩි කාලයක් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) විද්‍යා පීඨයේ රසායන විද්‍යා දෙපාර්තමේන්තුව වෙත 2000 වර්ෂයේදී ජපානයෙන් පරිත්‍යාග කරන JASCO FTIR Spectro Photometer උපකරණය, 2006 වර්ෂයේදී කාර්යාලයේ වායුසමීකරණ පද්ධතිය ක්‍රියාවිරහිත වීම හේතුවෙන් පාවිච්චියට ගත නොහැකි තත්ත්වයට පත්වී ඇති අතර, එය අලුත්වැඩියා කිරීමට කටයුතු නොකර වසර 12 ක කාලයක් නිෂ්ක්‍රීයව තිබුණි. තවද එම උපකරණ ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) විශ්වවිද්‍යාලය තුළ ශිෂ්‍ය ප්‍රායෝගික පුහුණුව හා වාහන අළුත්වැඩියාව සඳහා පැවති වාහන නඩත්තු ඒකකය 2017 පෙබරවාරි 17 දින අහෝසි කර, එයට අනුයුක්තව සිටි සේවකයන් 06 දෙනෙකු කාර්යය පැවරුමක් රහිතව විවිධ පීඨවලට අනුයුක්ත කර තිබූ අතර වැඩ දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබූ රු.511,953 ක් වටිනා එකී උපකරණ හා ආම්පන්න මාස 10 ක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) ඉදිකිරීම් කටයුතු අවසන් කර 2016 සැප්තැම්බර් 18 සිට 2018 පෙබරවාරි 18 දින දක්වා කාලය තුළ විශ්වවිද්‍යාලය වෙත පවරා දී තිබුණු රු.875,752,824 ක් වටිනා ශිෂ්‍ය නේවාසිකාගාර 04 ක අවශ්‍ය යටිතල පහසුකම් සපයා දී නොතිබීම නිසා 2018 සැප්තැම්බර් 10 වන විටත් එම නේවාසිකාගාර සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා ලබාදීමට නොහැකි වී තිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතට අනුකූල නොවන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කළ 2006 ජනවාරි 11 දිනැති අංක 871 දරන චක්‍රලේඛයට අනුව සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනා අදාළ කර නොගැනීම හේතුවෙන් විශ්වවිද්‍යාලයට රු.3,136,592 ක අධිභාරයක් ගෙවීමට සිදුව තිබුණි.

(ආ) සම සෞඛ්‍ය පීඨයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් සහ කළමනාකරණ පීඨයේ කුළුණු (Colonode) ඉදිකිරීම වෙනුවෙන් පිළිවෙලින් 2011 දෙසැම්බර් 15 දින හා 2016 දෙසැම්බර් 22 දින එකතුව රු.2,387,929 ක සචලීකරණ අත්තිකාරම් කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී තිබුණි. එහෙත් 2015 ජූනි 04 දින වනවිට සෞඛ්‍ය පීඨ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අත්හැර දමා තිබූ අතර කළමනාකරණ පීඨයේ කුළුණු ඉදිකිරීම ආරම්භ කිරීමකින් තොරවම අත්හැර දමා තිබුණි. එසේ වුවද එම කොන්ත්‍රාත්වලට අදාලව ලබාගෙන තිබුණු අත්තිකාරම් සුරක්ෂණය කල් ඉකුත් වීමට පෙර මුදල් කරවා නොගැනීම හේතුවෙන් එම වටිනාකමින් විශ්වවිද්‍යාලයට පාඩුවක් සිදු වී තිබුණි.

## 4.7 කාර්යමණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පීඊඩී/12 සහ 2003 ජූනි 02 දිනැති චක්‍රලේඛයේ 9.10 වගන්තිය පරිදි විශේෂඥ දැනුම ඇති පුද්ගලයන්ගේ හිඟකම හේතුවෙන් පුරප්පාඩු පිරවීමට අපහසු අවස්ථාවලදී හැරුණු විට අනුමත කාර්ය මණ්ඩලයේ දිගින් දිගටම පවතින පුරප්පාඩු හැකි ඉක්මණින් පිරවීමට හෝ අහෝසි කර දැමිය යුතු වුවත්, විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලයේ පවතින විශේෂඥ ගණයට අයත් නොවන පුරප්පාඩු 249 ක් පිරවීමට හෝ අහෝසි කර දැමීමට කටයුතු නොකර පුරප්පාඩු වශයෙන් දිගින් දිගටම පවතින බව නිරීක්ෂණය විය.

(ආ) විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 03 ක් සඳහා ස්ථිර පත්වීම් සිදු නොකර, කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඒඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 වගන්තියට අනුකූල නොවන පරිදි, 1990 සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 14 දෙනෙකු බඳවා ගෙන 2017 දෙසැම්බර් 31 දින වන විට දීමනා වශයෙන් මාසිකව රු.16,000 සිට රු.175,000 ක් දක්වා ගෙවා තිබුණි.

(ඈ) අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/15/1528/713/010 හා 2015 දෙසැම්බර් 03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ 11 ඡේදයට අනුකූල නොවන ලෙස විශ්වවිද්‍යාලය ස්ථිර කාර්ය මණ්ඩලයට ආරක්ෂක නිලධාරීන් 24 දෙනෙක් බඳවා ගෙන, 2016 ඔක්තෝබර් සිට වැටුප් හා දීමනා වශයෙන් රු.5,519,589 ක් හා විවිධ අරමුදල්වලට රු.704,226 ක් ගෙවා තිබුණි.තවද උක්ත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවන පරිදි අනුමත ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව 82 සිට 114 ක් දක්වා වැඩි කිරීමට වැටුප් හා සේවක කොමිෂන් සභාවේ අංක ඩීඑම්එස්/0011/පීඩීඑන් හා 2017 මැයි 18 දිනැති ලිපිය මගින් කටයුතු කර තිබුණි

## 5. තිරසාර සංවර්ධනය

--------------------

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

---------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය දැනුවත් වී තිබූ නමුත් තම විෂයය පථයට වැටෙන තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු ආකාරය සහ ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 6.1 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

------------------------------------------

#### 6.1.1 ප්‍රසම්පාදනයන්

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂමව, කාලීනව සහ උපරිම ආර්ථික වාසි අත්පත් කර ගැනීමේ අරමුණු ඇතිව, ප්‍රසම්පාදන සැලැස්ම වර්ෂය ආරම්භයේ පිළියෙල කර ඒ සඳහා අනුමැතිය ලබා ගෙන ඒ අනුව ක්‍රියාත්මක විය යුතු වුවත්, විශ්වවිද්‍යාලය විසින් 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම සඳහා පාලක සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර, 2017 ජූලි 19 දින සංශෝධනය කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම සඳහා පාලක සභාවේ අනුමැතිය ලබාගෙන තිබුණේ 2017 අගෝස්තු 29 දින දීය.

(ආ) 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තියේ සඳහන් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබූ අතර ඒ හේතුවෙන් ප්‍රමුඛතා අනුපිළිවෙලට හා නිශ්චිත කාලය තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකර තිබුණේද යන්න පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඇ) 2017 අයවැය ලේඛනයට අනුව කාණ්ඩ 04 ක් සඳහා රු.1,170,000,000 ක මුදලක් වෙන් කර තිබුණද ප්‍රසම්පාදන සැලසුමට අනුව එම කාණ්ඩ 04 සඳහා රු.7,544,150,000 ක ඇස්තමේන්තු පිරිවැයක් ඇතුලත් කර තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම අයවැය ලේඛනයට අනුගතව පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කලා පීඨයේ ශිෂ්‍යයන් සඳහා පොදු කාමරයක් ඉදිකිරීම පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2013 වර්ෂය සඳහා උසාවි නියෝගයකට අනුව අමතර ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇතුළත් කිරීමට සිදුවීම හේතුවෙන් ශිෂ්‍යයන් සඳහා පොදු කාමරයක් ඉදිකිරීම වෙනුවෙන් පවතින අර්ධ ස්ථිර ගොඩනැගිල්ල රු.10,895,120 ක වියදමින් වැඩිදියුණු කිරීමට සැලසුම් කර තිබූ නමුත්, අදාළ ශිෂ්‍යයන්ගේ අධ්‍යයන කටයුතු අවසන්කර වසර 02 ක කාලයක් ඉක්ම වන තෙක් මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකි වී තිබුණි.

(ii) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.1 වගන්තියට අනුකූලව ලැබී තිබුණු ලංසු විස්තරාත්මකව ඇගයීම් නොකිරීම හේතුවෙන් ඉංජිනේරු ඇස්තමේන්තුවේ අයිතමයන් 16 ක සියයට 100 සිට සියයට 900 දක්වා විචලනයන් පැවතියත්, ඒ පිළිබඳව අවධානය යොමු නොකර කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු කර තිබුණි.

(ආ) නිෂ්පාදන ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ගිනිගත් රසායනාගාර ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ රු.13,622,900 ක්වූ කොන්ත්‍රාත්තුවට අදාළ ඇස්තමේන්තුවේ අයිතම 03 ක් පරීක්ෂා කිරීමේදී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන ආයතනයේ සම්මත පිරිවිතරයන් භාවිතා නොකිරීම නිසා රු.145,535 ක මුදලක්ද මධ්‍යම පළාත් සභාවේ සම්මත මිල ගණන් (Building Schedule of Rate BSR) භාවිතා නොකිරීම නිසා රු.251,763 ක මුදලක්ද වැඩිපුර ඇස්තමේන්තු කර තිබුණි. තවද මෙම ඉදිකිරීමට අදාළ ගිවිසුම්ගත ප්‍රමාණ පත්‍රයේ ඇතුළත් රු.3,264,125 ක් වටිනා අයිතම් 20 ක් විවිධ හේතු නිසා ඉවත් කර තිබුණි.

**6.1.3 ප්‍රමාද වූ ව්‍යාපෘති**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැය සමග අනුගත වෙමින් ප්‍රමුඛතාවය අනුව පුනරුත්තාපන ව්‍යාපෘතීන් සැලසුම් කර මනා අධීක්ෂණයක් සහ පාලනයක් යටතේ ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල ආරම්භ කර තිබුණු වටිනාකම රු.244,891,745 ක් වූ පුනරුත්ථාපන ව්‍යාපෘතීන් 37 ක ගිවිසුම්ගත කාලය 2017 දෙසැම්බර් 31 දින වන විට ඉක්ම ගොස් තිබුණද, වැඩ නිමකර නොතිබුණි. තවද ඉහත කාලපරිච්ඡේදය තුළ ප්‍රදානය කර තිබූ වටිනාකම රු.33,800,832 ක් වූ පුනරුත්ථාපන ව්‍යාපෘතීන් 11 ක වැඩ 2017 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ වැඩ අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දීමට නියමිත දිනය ඉක්මවා තිබුණු වටිනාකම රු.2,464,881,408 ක් වූ නව ඉදිකිරීම් ව්‍යාපෘති 09 ක වැඩ නිමකර 2017 දෙසැම්බර් 31 දින වන විටත් විශ්වවිද්‍යාලය වෙත භාර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ඉදිකිරීමට සැලසුම්කර තිබුණු රු.86,000,000 ක් ඉදිකිරීම් ව්‍යාපෘති 05 ක් ප්‍රතිපාදන ලබාදී තිබූ නමුත් විශ්වවිද්‍යාලය මගින් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 6.2 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.1.3 ඡේදය ප්‍රකාරව, පාලක මණ්ඩලය අනුමත කරන ලද සංශෝධිත අයවැය අදාළ වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාරය, අදාළ අමාත්‍යාංශය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 වර්ෂයේ සංශෝධිත අයවැය සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන තිබුණේ 2018 මැයි 03 දිනදීය.

## 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාලය විසින් පීය 03 ක් පවත්වාගෙන යන අක්කර 73 ක් හා පර්චස් 53.4 ක් වන ඉඩම් විධිමත් පරිදි විශ්වවිද්‍යාලය වෙත පවරා ගෙන ඒවායේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) අත්සන් ලේඛනයක හෝ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම සහ පිටවීම සටහන් කිරීම මගින් සේවයේ නියුක්ත බව තහවුරු කර නොගෙන 2017 වර්ෂයේදී නිලධාරීන් හා ආචාර්යවරුන් 849 ක් වෙත රු.2,287,733,499 ක මුදලක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(iii) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් සහ සේවකභාරකාර අරමුදල් ගණනය කිරීමේදී අධ්‍යයන දීමනා අදාළ කර ගැනීම නිසා 2017 වර්ෂයේදී විශ්වවිද්‍යාල අරමුදලට සිදු වී ඇති පාඩුව රු.93,213,994 ක් විය.

## 6.4 සමාජ වගකීම් ඉටු කිරීම

-----------------------------

2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළවන කොටස ප්‍රකාරව අපද්‍රව්‍ය විමෝචනය හෝ බැහැර කිරීම සඳහා පරිසර ආරක්ෂක බලපත්‍රයක් ලබාගෙන ඊට අදාළව කටයුතු සිදු කළ යුතු වුවත්, විශ්වවිද්‍යාලයේ විද්‍යාගාරවල භාවිතා කර ඉවත් කරනු ලබන රසායනික ද්‍රව්‍ය හා දිරාපත් නොවන ද්‍රව්‍ය විශ්වවිද්‍යාල භූමියේ සකස් කරන ලද වලකට බැහැර කර තිබුණි. තවද, විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාර 03 ක මළ අපවහන පද්ධතීන් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අවිධිමත් ලෙස පරිසරයට මුදා හැර තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| | ----------------------------- | --------------- |
| (අ) | ගිණුම්කරණය | ඇතැම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති නිවැරදි ලෙස අනුගමනය නොකිරීම. |
| (ආ) | ණයගැති හා ණයහිමි පාලනය | ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ප්‍රසම්පාදනය | ඇතැම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය නොකිරීම. |
| (ඈ) | වත්කම් පාලනය | නිෂ්කාර්ය වත්කම් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |
| (ඉ) | කොන්ත්‍රාත් පරිපාලනය | ඇතැම් ඉදිකිරීම් කටයුතු ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාත්මක නොකිරීම. |